**ශ්‍රී ලංකා මහ බැංකුව - 2022**

**-----------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශ්‍රී ලංකා මහ බැංකුවේ ("බැංකුව") 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් සහ සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ, 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තියේ සහ මුදල් නීති පනතේ 42(2) වගන්තියේ (422 අධිකාරිය) ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මෙම විගණනය සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින වරලත් ගණකාධිකාරී සමාගමක සහාය මා ලබා ගන්නා ලදී.

බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යයසාධනය සහ මුදල් ප්‍රවාහ ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට (IFRSs) අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

මා විසින් ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISAs) අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. එම ප්‍රමිතීන් යටතේ මාගේ වගකීම් මාගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම් කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මුදල් මණ්ඩලයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම මුදල් මණ්ඩලයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, බැංකුව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම මුදල් මණ්ඩලයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය බැංකුව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

බැංකුවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, බැංකුවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා බැංකුව විසින් පවත්වාගෙන යා යුතුය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ජාත්‍යන්තර විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ජාත්‍යන්තර විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කිරීම පිණිස බැංකුවේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ මුදල් මණ්ඩලය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් බැංකුවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත බැංකුවේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ බැංකුවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැළසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ බැංකුවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව බැංකුව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව බැංකුව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව බැංකුව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනයන්ට අනුව, සමාලෝචිත වර්ෂයේ බැංකුවේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. බිලියන 374.3 ක ශුද්ධ අලාභයක් වූ අතර ඊට සාපේක්ෂව ඉකුත් වර්ෂයේ ශුද්ධ ලාභය රු. බිලියන 158.2 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු. බිලියන 532.5 ක අඩුවීමක් පිළිබිඹු විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව විදේශීය මූල්‍ය ආයෝජන ආදායමේ සැලකිය යුතු අඩුවීම, මෙම පහළයාමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් අයිතමවල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ බැංකුවේ ප්‍රධාන ආදායම් විෂයයන් සහ ප්‍රධාන වියදම් විෂයයන්, ඉකුත් වර්ෂය සමඟ සසඳා විශ්ලේෂණය කර පහත දක්වා ඇත.

| | 2022 | 2021 | විචලනය {හිතකර/(අහිතකර)} | |
|---|---|---|---|---|
| | රු. බිලියන | රු. බිලියන | රු. බිලියන | ප්‍රතිශතය % |
| **විදේශීය මූල්‍ය වත්කම් ආශ්‍රිත ආදායම** | **(135.7)** | **66.6** | **-202.3** | **(303.8)** |
| පොලී ආදායම | 1.5 | 4.4 | -2.9 | (65.9) |
| උපලබ්ධි නොවූ මිල ප්‍රත්‍යාගණන ලාභය / (අලාභය) | (127.3) | 41.9 | -169.2 | (403.8) |
| මිල වෙනස්වීම්වලින් උපලබ්ධි වූ ලාභය /(අලාභය) | (9.9) | 20.3 | -30.2 | (148.8) |
| **විදේශීය මූල්‍ය බැරකම් ආශ්‍රිත වියදම්** | **33.0** | **1.3** | **-31.7** | **(2,438.46)** |
| පොලී වියදම් | 32.3 | 3.6 | -28.7 | (797.2) |
| විදේශීය මූල්‍ය වත්කම් මත අපේක්ෂිත ණය අලාභ ආපසු හැරවුම්/(අයකිරීම්) | (0.7) | 2.3 | -3.0 | (130.4) |
| **ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන වාසිය/ (පාඩුව)** | **(610.1)** | **34.0** | **-644.1** | **(1,894.4)** |
| **දේශීය මූල්‍ය වත්කම් ආශ්‍රිත මුළු ශුද්ධ ආදායම** | **437.7** | **58.9** | **378.8** | **643.1** |
| **වෙනත් ආදායම්** | **2.4** | **16.3** | **(13.9)** | **(85.3)** |
| **වෙනත් වියදම්** | **10.3** | **-** | **(10.3)** | **(100)** |
| **මෙහෙයුම් වියදම්** | **25.3** | **16.3** | **-9.0** | **(55.2)** |
| **බදු** | **-** | **-** | **-** | **-** |
| **වර්ෂය සඳහා ලාභය (අලාභය)** | **(374.3)** | **158.2** | **-532.5** | **(336.6)** |

(අ) මුදල් නීති පනතේ 41 වන වගන්තියට අනුව, බැංකුවේ වාර්ෂික ලාභ හා අලාභ ගණනය කිරීමේදී, විදේශ විනිමය ප්‍රත්‍යාගණන ලාභ හෝ අලාභ ඇතුළත් නොකළ යුතුය. එබැවින්, සමාලෝචිත වර්ෂය සඳහා වූ ලාභය රු. බිලියන 235.8 ක් වූ අතර (ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන අලාභය රු. බිලියන 610.1 ක් හැර) ඊට සාපේක්ෂව පසුගිය වර්ෂයේ ලාභය රු. බිලියන 124.1 ක් වූයෙන් (ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන ලාභය රු. බිලියන 34 ක් හැර) ලාභයේ රු. බිලියන 111.7 ක වර්ධනයක් පිළිබිඹු විය.

(ආ) මුදල් නීති පනතේ 38 සහ 41 වැනි වගන්ති හා මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද බැංකුවේ ලාභ බෙදා හැරීමේ ප්‍රතිපත්තියට (2018 වර්ෂයේ සිට බලාත්මක) අනුව තීරණය කරන ලද සමාලෝචිත වර්ෂයේ බෙදා හැරිය හැකි ලාභය රු.බිලියන 235.03 ක් වූ අතර, ඊට සාපේක්ෂව පසුගිය වර්ෂයේ බෙදා හැරිය හැකි ලාභය රු.බිලියන 74.6 ක් විය. මුදල් නීති පනතේ 39(ආ) වගන්තියට අනුව, ප්‍රාග්ධනයට දේශීය වත්කම්හි අනුපාතය සියයට 15 දක්වා ළඟාවන තෙක් ඉතිරිව ඇති ශුද්ධ ලාභය අතිරික්තයට ගෙන යා යුතුය. ඒ අනුව, රු. බිලියන 235.03 ක් වූ 2022 වර්ෂයේ සමස්ත බෙදා හැරිය හැකි ලාභය අතිරික්තයට මාරු කිරීමට තීරණය කර තිබුණි. කෙසේ වෙතත්, 2021 වර්ෂයේ බෙදා හැරිය හැකි ලාභයෙන් රු.බිලියන 30 ක් හෙවත් සියයට 40 ක් ඒකාබද්ධ අරමුදලට බෙදා හැර තිබුණි.

## 2.3 බැංකුවේ ශේෂපත්‍ර අයිතමවල ප්‍රවණතා විශ්ලේෂණය

(අ) බැංකුවේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවලට අනුව, බැංකුව සතුව ඇති භාණ්ඩාගාර බිල්පත් තොගයේ වටිනාකම 2021 වර්ෂය අවසානයට පැවති රු. බිලියන 1,351 (පොත් අගය) සිට 2022 වර්ෂය අවසාන වන විට රු.බිලියන 2,481 (පොත් අගය) දක්වා වැඩිවිය. එය 2019 හා 2020 වර්ෂ අවසාන වනවිට පිළිවෙලින් රු.බිලියන 25 (පොත් අගය) ක් හා රු.බිලියන 638 (පොත් අගය) ක් විය. ඒ අනුව, බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් තොගයේ වටිනාකම, රජය විසින් නිකුත් කර ඇති භාණ්ඩාගාර බිල්පත් තොගයෙන් 2021 වර්ෂය අවසාන වන විට සියයට 59.5 සිට 2022 වර්ෂය අවසාන වන විට ආසන්න වශයෙන් සියයට 60 දක්වා වැඩිවී තිබුණි.

(ආ) දේශීය මූල්‍ය වත්කම්වල වටිනාකම 2021 වර්ෂය අවසානයට පැවති රු.බිලියන 2,221.7 සිට 2022 වර්ෂය අවසානයට රු.බිලියන 3,492.9 හෙවත් සියයට 57.2 දක්වා සැලකිය යුතු ලෙස වැඩිවී තිබුණි. අතැති භාණ්ඩාගාර බිල්පත්වල වටිනාකම රු.බිලියන 1,129.5 කින් වැඩිවීම මීට ප්‍රධාන වශයෙන්ම හේතුව විය. මුදල් නීති පනතේ 39(ආ) වගන්තියට අනුව, ව්‍යවස්ථාපිත ප්‍රාග්ධනයට දේශීය වත්කම්හි අනුපාතය සියයට 15 ක් විය යුතුය. කෙසේ වෙතත්, 2022 වර්ෂය අවසානයට මෙම අනුපාතය සියයට 2.34 ක් විය.

(ඇ) බැංකුවේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවලට අනුව, බැංකුවේ විදේශ වත්කම්වල වටිනාකම 2021 වර්ෂය අවසානයට පැවති රු. බිලියන 798.8 සිට 2022 වර්ෂය අවසාන වන විට රු.බිලියන 991.4 දක්වා රු.බිලියන 192.6 කින් හෙවත් සියයට 24 කින් වැඩිවී තිබුණි. බැංකුව විසින් ප්‍රසිද්ධ කරනු ලබන සතිපතා වාර්තා අනුව, 2021 අගෝස්තු මාසයේදී බැංකුවේ ශුද්ධ විදේශ වත්කම් රු.බිලියන 83.9 ක ඍණ ශේෂයක් වාර්තා කිරීම ආරම්භ කර තිබුණි. 2022 දෙසැම්බර් අවසාන වන විට මෙම ඍණ ශේෂය රු.බිලියන 1,613.9 දක්වා වැඩිවී තිබුණි. කෙසේ වෙතත්, 2023 ජූනි අවසාන වන විට ඍණ ශුද්ධ විදේශ වත්කම් ශේෂය රු.බිලියන 963.0 දක්වා අඩු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාර කරගෙන යන සමාගම්වලට බලපත්‍ර නිකුත් කිරීම, නියාමනය සහ අධීක්ෂණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාර කරගෙන යන සමාගම්වලට බලපත්‍ර නිකුත් කිරීම, නියාමනය සහ අධීක්ෂණය, 2016 ජූලි 15 දින සිට බලපැවැත්වෙන පරිදි 2016 අංක 06 දරණ ක්ෂුද්‍ර මූල්‍ය පනත යටතේ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් සිදු කරනු ලබයි. තැන්පතු භාර ගන්නා සහ ප්‍රධාන වශයෙන් අඩු ආදායම්ලාභීන්ට හා ක්ෂුද්‍ර ව්‍යවසායයන්ට මූල්‍ය සේවා සපයන සමාගම් (ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාර) මෙම පනත යටතේ | එකඟ වේ.<br>නීතිය අනුව එය එසේ වේ. | තැන්පතු භාර නොගන්නා නමුත් අඩු ආදායම්ලාභීන්ට හා ක්ෂුද්‍ර ව්‍යවසායයන්ට මූල්‍ය සේවා |

| | | |
|---|---|---|
| බලපත්‍රයක් ලබා ගත යුතුය. තැන්පතු භාර නොගන්නා නමුත් රට තුළ සිටින අඩු ආදායම්ලාභීන්ට හා ක්ෂුද්‍ර ව්‍යවසායයන්ට මූල්‍ය සේවා සපයන සමාගම් මෙම පනත යටතේ බලපත්‍රයක් ලබා ගැනීමට අවශ්‍ය නොවේ. එබැවින් එවැනි සමාගම්, මෙම පනත යටතේ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් 2023 නොවැම්බර් අවසාන වන විටත් නියාමනය හා අධීක්ෂණය නොකරනු ලබයි. | | සපයන සමාගම් නියාමනය අවශ්‍ය වේ. |

## 3.2 බැංකුවේ අධිපතිවරයාට විශ්‍රාම වැටුප් ගෙවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020.11.09 දින පැවති ආයතනික කළමනාකරණ කමිටු රැස්වීමේදී, බැංකුවේ අධිපතිවශයෙන් පත්කරන ලද තැනැත්තකු වෙනුවෙන් විශ්‍රාම ප්‍රතිලාභ සඳහා රීති, නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ රීතිවලට ඇතුළත් කිරීමට නිර්දේශ කර තිබුණු අතර මුදල් මණ්ඩලය 2020.12.23 දින පැවති එහි රැස්වීමේදී එය අනුමත කර තිබුණි. ඒ අනුව, බැංකුවේ අධිපති වශයෙන් පත්කරන තැනැත්තකු විශ්‍රාම ප්‍රතිලාභවලට හිමිකම් ලබන ලදි. කෙසේ වෙතත්, විශ්‍රාම ප්‍රතිලාභ සඳහා හිමිකම් ලැබීමට බැංකුවේ අධිපතිවරයා ලෙස සේවය කළ යුතු අවම කාලයක් අධිපතිවරයාට සම්බන්ධ විශ්‍රාම රීතිවල දක්වා නොතිබුණු බව නිරීක්ෂණය විය. | එකඟ වේ.<br>පාලක මණ්ඩලය යථා කාලයේදී මෙය සමාලෝචනය කරනු ලැබේ. | සමාලෝචන ක්‍රියාවලිය කඩිනම් කිරීම අවශ්‍ය වේ. |

## 3.3 රාජ්‍ය සුරැකුම්පත් කළඹ පවත්වාගෙන යාම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බැංකුව, රජයේ සුරැකුම්පත් ආයෝජන කළඹ එක්සෙල් පැතුරුම්පත් භාවිතා කරමින් අතින් කරන ක්‍රියාවලියක් (manually) ලෙස පවත්වාගෙන යන පවත්වාගෙන යන බව නිරීක්ෂණය විය. 2022 දෙසැම්බර් අවසාන වන විට රු. ට්‍රිලියන 2.5 කට ආසන්න ප්‍රමාණයක විශාල කළඹ නිසාවෙන් හා දැඩි මානව මැදිහත්වීම මත සිදුවිය හැකි වැරදි අවම කිරීමට රජයේ සුරැකුම්පත් ආයෝජන කළඹ නඩත්තු කිරීම ස්වයංක්‍රීය කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වර්තමාන ක්‍රියාවලිය අතින් කරන ක්‍රියාවලියක් ලෙස පවත්වා ගෙන ගියද, කළඹෙහි නිවැරදිතාවය පරීක්ෂා කිරීමට, පොදු ලෙජරයට යොදන සටහන් තහවුරු කිරීම වෙනත් දෙපර්තමේන්තු විසින් එවනු ලබන සහායක ලේඛන සමඟ ගැලපීම සහ පිළියෙල කිරීම හා පරීක්ෂා කිරීම වෙනස් නිලධාරීන් විසින් සිදු කිරීම වැනි වෙනත් ක්‍රියාමාර්ග පවතින නිසා අවදානම අවම වන බවට බැංකුව විශ්වාස කරනු ලැබේ.<br>තවද, බැංකුවේ රාජ්‍ය සුරැකුම්පත් කළඹ නඩත්තු කිරීම ස්වයංක්‍රීයකරණය කිරීමේ ක්‍රියාවලියෙහි මූල්‍ය දෙපාර්තමේන්තුව යෙදී සිටින අතර | ස්වයංක්‍රීය ක්‍රියාවලිය කඩිනම් කිරීම අවශ්‍ය වේ. |

|  |  |  |
|---|---|---|
|  | එය 2024 වර්ෂය මැදභාගය වන විට අවසන් කිරීමට සැළසුම් කර ඇත. |  |

**3.4 ඉන්දීය සංචිත බැංකුව (RBI) සමඟ විනිමය හුවමාරු පහසුකම් ගිවිසුමකට (Swaps) එළඹීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බැංකුව 2020 වර්ෂයේදී ඉන්දීය සංචිත බැංකුව සමඟ විනිමය හුවමාරු පහසුකම් ගිවිසුමකට එළඹී තිබුණි. මෙම පහසුකම යටතේ එක්සත් ජනපද ඩොලර් මිලියන 400 ක දෙවන කොටස 2022 ජනවාරි මාසයේදී ක්‍රියාත්මක වූ අතර 2022 අප්‍රේල් මාසයේදී නැවත අලුත් කරන ලදි. එය 2022 ජූලි මාසයේ සිට ගෙවීමට නියමිත විය. ඉන්දීය සංචිත බැංකුවෙන් ලද තහවුරු කිරීම අනුව, එක්සත් ජනපද ඩොලර් 72,728 ක් දඩ පොලී ලෙස අයකර ඇති බව නිරීක්ෂණය විය. | එකඟ වේ.<br>2023 වර්ෂයේ දී දඩ පොලී ගෙවීම පිළිබිඹු කිරීමට ගිණුම් නිවැරදි කරන ලදි. මුදල ප්‍රමාණාත්මක නොවන නිසා, 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නොගලපන සටහනක් ලෙස සලකන ලදි. | දඩ පොලී ගෙවීම් වළක්වා ගැනීම අවශ්‍ය වේ. |

**3.5 ශ්‍රමික ප්‍රේෂණ මත ගනුදෙනු පිරිවැය ප්‍රතිපූරණය කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විධිමත් අරමුදල් එවීමේ මාර්ග හරහා රට තුළට එවන ශ්‍රමික ප්‍රේෂණ වැඩිකිරීම දිරිමත් කිරීමේ අරමුණින් ගනුදෙනුවකට රු.1,000 ක ස්ථාවර ගෙවීමක් ලෙස, රටතුළට එන ශ්‍රමික ප්‍රේෂණ මත දරනු ලබන ගනුදෙනු පිරිවැය ප්‍රතිපූරණය කිරීමෙන් විදේශගතව සේවය කරන ශ්‍රී ලාංකිකයන්ට දිරිදීමනාවක් ගෙවීමට බැංකුව තීරණය කරන ලදි. මේ සම්බන්ධ මෙහෙයුම් උපදෙස් 2022 ජනවාරි 19 දින නිකුත් කරන ලදි. 2022 වර්ෂය තුළදී මේ සම්බන්ධව දරන ලද මුළු වියදම රු. බිලියන 10.3 කි. තවද, 2020.12.22 දින බැංකුව විසින් නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස් අනුව, විධිමත් අරමුදල් එවීමේ මාර්ග හරහා රට තුළට එවන ශ්‍රමික ප්‍රේෂණ දිරිමත් කිරීමේ අරමුණින් යුක්තව එක්සත් ජනපද ඩොලරයකට රු. 2 ක දිරිදීමනාවක් ගෙවීමට අයවැයෙන් යෝජනා කර තිබුණි. තවද, 2021.12.01 දින සිට 2022 මාර්තු 9 දක්වා කාලය තුළ එක්සත් ජනපද ඩොලරයකට රු. 8 ක අමතර දිරිදීමනාවක් ලබා දෙන ලදි. කෙසේ වෙතත්, 2020, 2021 හා 2022 වර්ෂවල ලැබුණු මුළු ශ්‍රමික ප්‍රේෂණ පිළිවෙලින් එක්සත් ජනපද ඩොලර් මිලියන 7,103.9ක්, එක්සත් ජනපද ඩොලර් මිලියන 5,491.5 ක් හා එක්සත් ජනපද ඩොලර් මිලියන 3,789.5 ක් විය. | එකඟ වේ. | අනාගතයේදී මෙවැනි ආකාරයේ තීරණ ගැනීමේදී, විනිමය අනුපාත ප්‍රතිපත්තියේ පැවති ප්‍රධාන ගැටලුවට ප්‍රතිචාර දැක්වීම අවශ්‍ය වේ. |